

ලියා දන්වන වග යි

## යහපත් හෙටක්?

ලියාදිංචි ඡන්ද දායකයින්ගෙන් හරි අඩක්ම අනුමත නොකළ ද රටේ අනාගතය උදෙසා තීන්දු තීරණ ගැනීම පිණිස මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා ප්‍රමුඛ රජයට යළිත් වරක් බහුතර බලය ජනතාව පවරා තිබේ. තමන් විසින් මහජන නියෝජිතයන් ලෙස පත්කර යවන ලද පාර්ලිමේන්තුවේ මන්ත්‍රී සංයුතිය පිළිබඳ රට තුළින්ම විශ්මයක් හා හාස්‍යයක් මතු වුව ද තෝරා දුන් බලය මතින්ම ඒ විශ්මයද යටපත්වී ඇත්තේ ය.

වසර 30 ක යුද්ධය අවසන් වී වසරක් ගෙවිණි. අවශ්‍ය බලයද පිරිවර ද ප්‍රාදේශීය සභා මට්ටමේ සිට ඉහළටම ලැබී තිබේ. එහෙත් තවමත් රට වැටී ඇති අගාධයෙන් ගොඩ ගත හැකි නිවැරදි වැඩ පිළිවෙලක් ප්‍රායෝගිකව ඉදිරිපත් නොවී ම බෙදයකි. මහින්ද චින්තනය හා උතුරු වසන්තය ආසියාවේ ඓශ්වර්යය දක්වා පිම්මක් පනින්නට සැරසෙන මොහොතේ ඒ සඳහා නිශ්චිත ස්ථිරසාර දැක්මක් හා න්‍යාය පත්‍රයක් ගොඩ නැගීම සඳහා අත්‍යවශ්‍ය සාධකය වන රජයේ වාර්ශික අය වැය වාර්තාව ඉදිරිපත් කිරීමෙන් වළකින්නට මේ නව රජය උත්සාහ දැරීම ජනතාවගේ කුකුසට හේතුවක් වෙයි. ඒ වෙනුවට රජය අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කිරීමට සැරසීම රජයේ ඉදිරි වැඩ පිළිවෙල පිළිබඳව ප්‍රශ්නාර්ථයක් මතු කරවයි.

අය වැයක් යනු රජය ඉදිරි වර්ශය සඳහා සංවර්ධන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට ඉදිරිපත් කරන සැළැස්මයි. රට හෙට දිනයේ මුහුණ දෙන අභියෝග ජය ගැනීම සඳහා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙල හා සැකැස්ම අයවැයෙහි අන්තර්ගතයයි. රටක මූල්‍ය පාලනය පිළිබඳ පැවැත්මද තීරණය වන්නේ අය වැයක සමබරතාව මතයි. ආණ්ඩුව ඉදිරි වර්ෂයේ කුමන ක්ෂෙත්‍රයක වියදම් කරන්නේද ඉන්පසු ඒවා පියවා ගනු ලබන ආදායම් මාර්ග කෙරෙහිද අවධානය යොමු කර එම ආදායමට වැඩි වියදම පියවා ගැනීමේ යෝජනා ඉදිරිපත් කර ජනතාවගෙන් එම ප්‍රමාණය ලබා ගැනීම සාමාන්‍ය අයවැයක ක්‍රියාවලියයි. එහෙත් අතුරු සම්මත ගිණුමක් යනු අය වැය ලේඛණය මෙන් ආදායම් ලබන මාර්ග පිළිබඳව සළකා බලා වියදම් කරන ප්‍රමාණයන් හා ක්ෂෙත්‍රයන් තීරණය කරන ලේඛණයක් නොව මෙතෙක් කල් කරගෙන ආ කටයුතු (වියදම්) තවත් කාලයක් ඉදිරියට කරගෙන යාමට ඉදිරිපත් කරන ලේඛණයක් පමණි. අතුරු සම්මත ගිණුම යනු නව සැළැස්මක් නොව පැරැන්නම තවත් කාලයකට දික් කිරීම පමණි.

රජය කුමක් කීවද සැබෑ තත්වය නම් තවමත් රජයට රටේ අනාගතය සම්බන්ධයෙන් නිශ්චිත සැළැස්මක් හෝ වැඩ පිලිවෙලක් සකස් කර ගත හැකි තත්වයක නොමැති බව නොවේ ද? කුමන ආකාරයට පාරම් බෑවත් වැඩ පිළිවෙලක් අරමුණක් නැති රටකට යහපත් හෙට දවසක් ගැන සිතිය හැකිවේද?
යහපත් රටක් ගොඩ නගන්නට පෙරුම් පුරන නායකයකු සතු කාර්යය විය යුත්තේ රට තුළ ඇති සමාජ ආර්ථික හා දේශපාලන ගැටලු ගැඹුරු අධ්‍යනයකට ලක්කර එම ගැටලු වලට හේතු විද්‍යාත්මකව පතුළෙන්ම හඳුනා ගැනීමයි. එක් රටක් තුළ විවිධ ජාතීන් සමානාත්මක පදනමක් යටතේ සමගි කිරීමයි. කෘෂි නිශ්පාදන හා කාර්මික නිෂ්පාදන ක්ෂෙත්‍ර ගොඩ නැංවීමයි. සමාජ සුබසාධනයන් නගා සිටුවීම වැනි ප්‍රධාන කරුණු සඳහා සැළසුම් සහගත වැඩ පිළිවෙලක් තුළ රට ගාඩ නැංවීම අපහසු කරුණක් නොවන්නේ පසුගිය රජයන්ට මුහුණ දීමට තිබූ ගැටලු වලින් හරි අඩක්ම දැන් විසඳී ඇති නිසාය. ජනතාවද රජය සමග සහයෝගයෙනි. මේ සුහද රැල්ල බියකරු සුනාමියක් සේ ආපසු කැරකී එනතෙක් කෙකර ගාමින් නොසිටීමට රජයට සිත් පහළ වේවායි අපි පතමු.

**සංස්කාරක**

**සන්නස**
**අන්තර්ජාලයෙන් කියවන්න**
www.sannasa.net




සන්නස
නව සහශ්‍රයට
SANNASA

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**උපදේශක සංස්කාරක / Advisory Editor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක /Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

සේයා රූ
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සමබන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**SA**
Chandra Eeriyagama
08 8331 2318

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**ACT**
Asoka Nimalasiri
0400 429 031

**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax : 03 3796 4241

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

## සංස්කාරක සටහන

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .